# ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම සහ ග්‍රාමීය ජනතාව ණය ලබාගැනීමේදී මුහුණ දෙන ගැටලු

**ජී.ඒ.ටී නිමේෂිකා**
තාවකාලික කථිකාචාරිනී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය
gatnimeshi@gmail.com

## හැඳින්වීම

තුන්වන ලෝකයට අයත් සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්විය හැකිය. එහිලා මුළු ජනගහනය මිලියන 20ක් පමණ වන අතර ග්‍රාමීයව ජීවත්වන ජනගහනය 70% පමණ වෙයි. ග්‍රාමීය ජනගහනයෙන් වැඩිදෙනෙකු කෘෂිකර්මාන්තයෙන් යැපෙන්නන්ය. මෙහිදී කෘෂි අංශය ව්‍යාපාරික කෘෂි අංශය හා දේශීය කෘෂි අංශය වශයෙන් දෙයාකාර වෙයි. වගාබිමෙන් වැඩි ප්‍රමාණයක් යෙදවී ඇත්තේද කෘෂිකාර්මික කටයුතු සඳහාය. කෙසේ නමුත් මෙම ග්‍රාමීය පෙදෙස්වල ජීවත්වන කෘෂිකාර්මික යැපෙන්නන් අතර ඔවුන්ගේ ජීවන මට්ටම පහළ මට්ටමක පවතී. එයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ පවුලක යැපෙන්නන් සංඛ්‍යාව වැඩිවීමත් ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකරගැනීමට ප්‍රමාණවත් තරම් මූල්‍ය පහසුකම් නොමැතිවීමත්ය. මෙහිදී මූල්‍ය පහසුකම් යන්නට මුදල් පමණක් නොව මුදල්වලින් මිණිය හැකි යන්ත්‍රසූත්‍ර, උපකරණ, පොහොර යනාදිය මෙන්ම වඩාත් හොඳ වගාකිරීමේ විද්‍යාත්මක ක්‍රම පිළිබඳව අධ්‍යාපනයක් සහ ප්‍රයෝජන ,කෙලින්ම නොවූවද වක්‍රව ලැබිය හැකි කෘෂිකාර්මික පර්යේෂණ පවාද ඇතුලත්ය. මේවා සපයා ගැනීමට ඔවුන්ගේ ආර්ථිකයේ පවතින ශක්‍යතාවය අඩුකම නිසාවෙන් ආයතනික හා ආයතනික නොවන අංශ වලින් ණය පහසුකම් ලබාගැනීමට කටයුතු කරනු ලබයි.

වර්තමානය වනවිට බොහෝ ග්‍රාමීය පෙදෙස්වල ජීවත්වන්නන් අතර ණය පහසුකම් ලබාගැනීමේ ප්‍රවණතාවය ඉහළ මට්ටමක පවතී. ආයතනික වශයෙන් රජය ,වානිජබැංකු, සමූපකාර සමිති ,ග්‍රාමීය බැංකු වැනි ආයතනද ආයතනික නොවන අංශ වශයෙන් උකස් බඩුගන්නන්, වෘත්තීය ණය දෙන්නන්, ගම්බද කඩකාරයින්, ඥාතීන් හා හිතවතුන්ගෙන් ණය ලබාගැනීමට පෙළඹෙයි. වර්තමානයේ මිනිසුන් ආයතනික අංශවලට වඩා ආයතනික නොවන අංශවලින් වැඩියෙන් ණය ලබාගැනීමට පෙළඹී ඇත. මෙලෙස ලබා ගන්නා ණය පහසුකම් ඔවුන් සිය ජීවිතයේ නිෂ්පාදන අවශ්‍යතා මෙන්ම නිෂ්පාදන නොවන අවශ්‍යතා සඳහා ද යොදා ගනු ලබයි.

එමෙන්ම ග්‍රාමීය ජනතාවගේ කෘෂිකාර්මික කටයුතු සඳහා විවිධ ණය යෝජනා ක්‍රම රජය සහ මහබැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. ඇතැම් අවස්ථාවලදී ඒවා මගින් ණය ලබා ගැනීමට යාමේදී විවිධ ගැටලුවලට ජනතාවට මුහුණදීමට සිදුවේ. මෙම ලිපියෙන් ග්‍රාමීය අංශය තුල ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම සහ ණය ලබාගැනීමේදී ග්‍රාමීය ජනතාව විධිමත් සහ අවිධිමත් අංශය තුලදී මුහුණදෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කොට ඇත.

## ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයෙහි ස්වරූපය

ශ්‍රී ලංකාව ග්‍රාමීය රටක් වේ. ග්‍රාමීය යනු නාගරික හා වතු අංශවලට අයත් නොවූ සියලු කුටුම්භයන් අයත් වන අංශයයි. ඒ අනුව සියලු ගම්සහා ප්‍රදේශ ග්‍රාමීය ප්‍රදේශ ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 3/4ක්ම ග්‍රාමීය අංශයේ වාසය කරන අතර දළ දේශීය නිෂ්පාදිතයෙන් 1/4ට පමණ එම අංශය දායක වෙයි. මෙහිලා ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වන අතර එය ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් ලක්වාසීන්ගේ පරිභෝජනය සඳහා කෙරෙන ගොවිතැන සහ නිර්යාත සඳහා කෙරෙන වෙළඳභෝග යනුවෙනි. වෙළඳ භෝග යටතට තේ, රබර්, පොල් අයත් වේ. වගා බිමෙන් වැඩි ප්‍රමාණයක් යෙද වී ඇත්තේද කෘෂිකාර්මික කටයුතු සඳහාය. සේවා නියුක්තියෙන් වැඩි ප්‍රමාණයක් සෘජුව හෝ වක්‍රව කෘෂිකර්මය පදනම් වූ කර්මාන්තවල යෙදී සිටිති. එසේම බැංකු, රක්ෂණ, ප්‍රවාහන, වෙළඳාම වැනි සේවාවල පැවැත්ම සඳහාද කෘෂි අංශයේ දායකත්වයක් ඇත.

මෑත වර්ෂවල අපනයන ඉපයුම්වලින් 25%ක් පමණ දායකත්වයක් කෘෂිකාර්මික අපනයන තුලින් ලැබී ඇත (බණ්ඩාර,1996). එම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලින් බොහොමයක්

කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පවතින හෙයින් ශ්‍රී ලංකා ආර්ථිකය කෘෂි ආර්ථිකයක් යැයි පැවසිය හැකිය. එහෙත් ලක්වාසීන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීමට තවමත් එම අංශයට නොහැකි වී ඇත. මන්දයත් ඉඩම් හිඟයත්, ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීමත් හේතුකොටගෙන ජීවන මට්ටම ඉතා පහළ මට්ටමක පැවතීමයි. එම හේතුවෙන් ඵලදාවද ඉතා පහල මට්ටමක පවතියි. එයට හේතුව කුඩා ඉඩම්වල ඵලදාව පහල මට්ටමක පැවතීමයි. වැඩි ඵලදාවක් ලැබෙන ක්‍රම අනුගමනය කිරිම අපහසු වන අතර ප්‍රාග්ධනය යෙද වී ඇත්තේද මඳ වශයෙනි. ග්‍රාමීය ජනතාව නූගත් වන බැවින් අනුගමනය කරන ශිල්ප ක්‍රමද යල් පැන ගිය ඒවා වේ. එම ශිල්ප ක්‍රම අනුගමනය කිරීමෙන් ලැබෙන ඵලදාවද පහළ මට්ටමක බැවින් විශාල පිරිසක් අඩු ජීවන තත්ත්වයට පත්වේ. ඇතැම් අවස්ථාවලදී යැපුම් මට්ටමටත් වඩා අඩු ජීවන තත්ත්වයක් ඇති පුද්ගලයන් බොහෝ පිරිසක් වෙති. එවැනි ජන කොටසකගේ පැවැත්ම කෙරෙහි ස්වභාවික විපර්යාසයන් බෙහෙවින් බලපානු ලබයි. එහෙත් ජීවත්වීමේදී අඛණ්ඩව වියදම් දැරීමට සිදුවන නිසා හැමවිටම මූල්‍ය අවශ්‍යතා පිලිබඳ ගැටලුවක් මතුවෙයි.

නාගරික පවුලකට වඩා ග්‍රාමීය පවුලක් තුල සාමාජික සංඛ්‍යාව ප්‍රමාණයෙන් විශාල වෙති. එමෙන්ම අමතර රැකියා අවස්ථාද අඩුවීමක් දක්නට ලැබෙයි. කෙසේ නමුත් යැපෙන්නන් සංඛ්‍යාව විශාල බැවින් උපයන ආදායම වැඩි සංඛ්‍යාවක් අතර බෙදී යනු ඇත. ජීවන තත්ත්වය යැපුම් මට්ටමටත් වඩා පහල යනු ලබන්නේ මේ හේතුවෙනි. එම නිසා කෘෂිකර්මය ආශ්‍රිතව දියුණුවන්නන් අතර ණය ගැනීමේ ප්‍රවණතාවක් බහුල වශයෙන් දක්නට ලැබේ. මෙකී ප්‍රශ්නය ග්‍රාමීය අංශය තුල දක්නට ලැබෙන බලගතුම ප්‍රශ්නය වෙයි. මෙය නොවිසඳී දිගින් දිගටම පවත්නා හෙයින් ගම්බද ණය ගැතිකම උග්‍රවෙයි.

**කෘෂිකාර්මික ණය සහ එහි විවිධ ආකාර**

කෘෂිකර්මය සඳහා දෙන ණය විශේෂයෙන් වෙනත් අවශ්‍යතා සඳහා දෙන ලද ණයෙන් වෙනස් වේ. සුළු නිෂ්පාදකයා කර්මාන්තයට වඩා කෘෂිකර්මාන්තයෙහි වැදගත් තැනක් හිමිකර ගනු ලබයි. ආසියානු කෘෂිකාර්මික සමාජයන්හි විශාල වතු කැබලි කිරීමේ ලැදියාව වඩාත් දක්නට ලැබේ. මෙම රටවල පවත්නා උරුමය පිලිබඳ නීති අනුව ඉඩම් කැබලිවලට කැඩී යාම බැරෑරුම් ප්‍රශ්නයක් බවට පත්වී ඇත. පවුලක සාමාජික සංඛ්‍යාව වැඩි වන විට තම දරුවන් හට ඉඩම් සමසේ බෙදා දුන් විට එක් අයෙකුගේ සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කරයකින් ප්‍රමාණයට අඩුවේ. එක් අයෙකුට හිමි සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය කොතරම් කුඩාද කිවහොත් ඒවා තැපැල් මුද්දර ඉඩම් යන විරුදාවලියද ලබා ඇත ( සෙනෙවිරත්න ,1969 ).

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කෘෂි අංශය සැලකිල්ලට ගත් කල එහි ලක්ෂණ බොහෝය. විශේෂයෙන් විදේශ වෙළඳපොළ පරමාර්ථය දැඩි කරගෙන නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබයි. එතුලින් ලැබෙන විදේශ විනිමය රටේ සංවර්ධනයට ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් බැවින් විදේශ විනිමය ඉපයීම ආර්ථිකයේ ප්‍රධාන සාධකයක් වේ. ඒ හේතුවෙන් වතු කෘෂිකර්මය දියුණු කිරීම ප්‍රධාන අරමුණක් වේ. විශේෂයෙන් ග්‍රාමීය පෙදෙස්වල දක්නට ලැබෙන කුඩා තේ වතු, රබර් වතු, පොල් වතු ආදිය වැඩි දියුණු කිරීමට රජයේ හෝ කුමන ආයතනයකින් අනුබල දීම ගම්වැසියන්ගේ ජීවන ගමන් මගේ සතුටකට හේතුවනු ඇත.

කෘෂිකාර්මික අංශය තුල සිදුවන නිෂ්පාදන වලින් දේශීය පරිභෝජනය සුළුය. ඒවා නිෂ්පාදනය කරනු ලබන්නේ අපනයනය පදනම් කරගෙන බැවින් රට තුල භාවිතය අඩුවේ. එමෙන්ම මේවා තුලින් ලැබෙන ඵලදාව ඉහල මට්ටමක පවතී. කලින් කලට මිල උච්චාවචනය පැවතියත් ඵලදාව ඉහල මට්ටමක පවතින බැවින් ඉහල ආදායමක්ද ලබා ගත හැකිවේ.

රක්ෂණය බැංකු වැනි ක්ෂේත්‍රවල සේවාවන්ද සෘජුවම මේ සඳහා යොදා ගැණිනි. ඇතැම් අවස්ථාවලදී ජාත්‍යන්තර ප්‍රාග්ධනයද යොදා ගනු ඇත. එම නිසා ඉහළ මට්ටමක ආයෝජනයක් පවතී. අප රටට මෙහි උරුමය ලැබුවේ යටත් විජිතවාදයෙන් අනතුරුවය. මේ ආකාරයට වැදගත්කමක් ජනතාවට වතු කෘෂිකාර්මික අංශය තුල පවතින බැවින් ජනතාව ඒ කෙරෙහි නැඹුරු වීම වඩ වඩාත් දක්නට ලැබේ. එම නිසා ඒ අංශය දියුණු කිරීමට විවිධ ණය වර්ග ආයතනික

අංශයෙන් මෙන්ම ආයතනික නොවන අංශවලින්ද ලබා දෙනු ලබයි. පහත අරමුණු පදනම් කරගෙන ග්‍රාමීය අංශයට ණය දෙනු ලබයි.

- කෘෂි නිෂ්පාදනය හා සම්බන්ධ අරමුණු සඳහා වන ණය

- දීර්ඝ කාලීන ස්ථාවර ප්‍රාග්ධනය ,ඉඩම් මිලදී ගැනීම, ඒවා එළිපෙහෙළි කිරීම හා වැඩි දියුණු කිරීම, දීර්ඝකාලීන යන්ත්‍ර සූත්‍ර ආදිය මිලට ගැනීම.

- පාරිභෝගික කටයුතු සඳහා වන ණය.

- අත්‍යවශ්‍ය කටයුතු-ආහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස.

- අර්ධ අත්‍යවශ්‍ය කටයුතු- දරුවන්ගේ අධ්‍යාපනය, වෛද්‍ය පහසුකම්, පරිභෝජන භාණ්ඩ මිලට ගැනීම.

- අත්‍යවශ්‍ය නොවන කටයුතු-උත්සව වන්දනා ගමන්, ස්වර්ණාභරණ මිලදී ගැනීම ආදිය.

මේ ආදී වූ අරමුණු මූලික කොටගෙන ග්‍රාමීය අංශය තුල ජීවත්වන ජනයා ණය පහසුකම් ලබා ගනී. ඒවා ලබාගනුයේ ආයතනික අංශය හා ආයතනික නොවන අංශය මගිනි.

ආයතනික අංශය යටතේ බැංකු, සමූපකාර, ණය දෙන සමිති, සහ වෙනත් මූල්‍යායතන අයත් වේ. බොහෝ අවස්ථාවලදී ග්‍රාමීය ජනතාව හා බැඳී පවතින බැංකු ලෙස මහජන බැංකුව හා ලංකා බැංකුව හැඳින්විය හැකිය.

ආයතනික නොවන අංශය යටතේ පෞද්ගලික ණය සපයන්නන්, වෙළඳුන්, ප්‍රභූන් හා නෑදෑ හිතමිතුරන් වැදගත් වේ. පෞද්ගලික දැන හැඳුනුම්කම් මත සිදුවන මෙම ණය ගනුදෙනු බොහෝ විට සිදුවන්නේ දේපල උගසට ගැනීමෙන් හෝ අපේක්ෂිත අස්වැන්න උගසට ගැනීම තුලිනි. මෙම ණය සඳහා ඉතා ඉහල පොලී අනුපාතිකයන් අය කෙරේ.

කෙසේ නමුදු නූතන ජනයා මෙම අවිධිමත් අංශය තුලින් ණය ලබාගැනීමේ ප්‍රවණතාවය ඉතා ඉහල මට්ටමක පවතී. එහි වැදගත් ලක්ෂණයක් වන්නේ වෙළඳපොළේ විවිධ ආකාරයේ ණය සැපයුම්කරුවන් සිටීමයි.

ඉල්ලුම් අංශයෙන් ගත් කල කෘෂිකාර්මික කම්කරුවන්, අඳ ගොවියන්, මුදල් භෝග වවන ඉඩම් හිමි ගොවියන් වැනි විවිධ අන්දමේ ණය ගන්නා පිරිසක් දක්නට ලැබේ. බොහෝ විට අවිධිමත් ණය වෙළඳපොළේ ණය ගන්නා ඉතාමත්ම දිළිඳු පිරිසක් සිටිති. ඔවුන් අවිධිමත් අංශය කෙරෙහි නැඹුරු වීමේ ප්‍රමාණය ඉතා ඉහල මට්ටමක පවතී. එමෙන්ම එමගින් ලබා ගත් ණය පියවීම සඳහාද ඔවුන් වැඩි උනන්දුවක් දක්වති. අලුත් වගා ක්‍රම භාවිතා කිරීමට උපදෙස් ලබා දෙන විට මුදල් නොමැතිකම පවසන ගොවීන් ආයතනික අංශයේ අඩු පොලියට මුදල් ලබා දෙන විට ඒ මුදල් ප්‍රයෝජනයට නොගන්නේ මන්ද යන ප්‍රශ්නය මෙහිදී මතුවේ. එයට හේතු වශයෙන්

- රජයේ හෝ සමූපකාර වැනි විවිධ ආයතන වලින් සපයන ණය පිලිබඳ දැනුමක් හෝ ණය යොදවන ආකාරය පිලිබඳ දැනුමක් නොතිබීම.

- සමූපකාර හා වෙනත් ආයතනවලින් ණය සැපයීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ග දිගුකාලීන වන අතර ඒ සඳහා ආකෘති පත්‍ර රාශියක් සම්පූර්ණ කිරීමට සිදුවීම.

- බොහෝ ගොවීන් සමූපකාර සමිතිවල සාමාජිකත්වය ලබා නොතිබීම

- ඉඩම් කට්ටි කුඩාවීම. අක්කර භාගයකට අඩුනම් ණය ලබා ගැනීමට පෙළඹවීමක් ඇති නොවිය හැකිය.

- ආයතනික අංශය මගින් එක් වතාවක් ණය ලබාගත් පසු ඒ ණය නැවත නොගෙවා හැරීම සිදුකරයි. එවිට නැවත ඔවුන් සමූපකාරයෙන් ණය ලබාගැනීමට නුසුදුස්සන් බවට පත්වෙයි. එම හේතුවෙන් වගා ණය සඳහා පුද්ගලික අංශය වෙත නැඹුරුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

● ආයතනික අංශය තුලින් ණය ලබා ගැනීමේදී විවිධ පෝරම සම්පූර්ණ කිරීමට සිදුවීම, ලියකියවිලි ඉදිරිපත් කිරීම, වැනි දෑ අත්‍යවශ්‍ය වේ. එහෙත් සියලුම පුද්ගලයෝ සාක්ෂරතාවයෙන් හෙබි පුද්ගලයෝ නොවන බැවින් මෙය ඉතා අපහසු වේ. එමෙන්ම ගම්බද පෙදෙස්වල නූගත් ජනතාව සිටින බැවින් ඔවුන් වැඩි වශයෙන් යොමුවන්නේ ආයතනික නොවන අංශය කෙරෙහිය.

**ආයතනික නොවන අංශය කෙරෙහි පෙළඹීමට හේතු**

ආයතනික නොවන අංශය තුල ණය දෙන්නා දැන හැඳුනුම්කමක් ඇති පුද්ගලයෙකු වන බැවින් ආයතනික අංශයෙන් ණය ලබාගැනීමේදී මෙන් ගොවි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ. එමෙන්ම ආයතනික අංශයේ ණය ලබාගැනීම කාර්යාල වේලාවන් තුල තම වැඩ කටයුතුවලට බාධා කරගනිමින් යෑමට සිදුවේ. ආයතනික නොවන අංශයෙන් ණය ලබාගැනීමේදී එවැනි කාල පමාවක් සිදු නොවන අතර තමන්ට අවශ්‍ය වේලාවක තම වැඩ කටයුතු නිමා වී රාත්‍රී කාලයේ වුවද ණය දෙන්නා හමුවිය හැකිවීමද පහසුවකි.

බොහෝ විට ආයතනික අංශය තුල ණය සැපයෙන්නේ වගා ණය සඳහා පමණි. නමුත් අස්වැන්න ලබා ගන්නා කාලය තෙක් ජීවත් වීමට ණය ලබාගත හැකි පහසුම මූලාශ්‍රය ආයතනික නොවන අංශයයි. වෙළෙඳුන්ගෙන් භාණ්ඩ වශයෙන් මෙන්ම මුදල් වශයෙන්ද ණය ලබා ගත හැකිය.

ගැමියන් ආයතනික අංශය තුල පවතින නිලධාරීවාදයටද එතරම් කැමැත්තක් නොදක්වති. කෘෂිකාර්මික ණය ක්ෂේත්‍රය දේශපාලන හා අනෙකුත් බලපෑම් කරන කණ්ඩායම්වල ඇඟිලි ගැසීම්වලින් තොරව පැවතිය යුතුය. සමහර ණය මුදල්වලට එනම් පොලී රහිත වූ ණය මුදල් සඳහා කිසියම් භාණ්ඩ හුවමාරුවක් හැටියට සලකා සැඟවුණු පොලියක්ද තිබිය හැකි හෝ ආයතන නොවන ණය මූලාශ්‍රවලින් යම් වාසියක් හෝ ඇතිවන බව කිව හැකිය. සුළු ඇපයක්වත් මේ සඳහා අවශ්‍ය නොවන අතර ණය ගනුවාට පහසු පරිදි ණය ආපසු ගෙවිය හැකිය ( ආර්ථික විමසුම,1979 ,පිටුව. 04 ).

එබැවින් අවිධිමත් ණය මූලාශ්‍රවල පහසුකම නම්‍යතාවය, සුගමකම ග්‍රාමීය අංශය තුල එම ණය කෙරෙහි වැඩිපුර රැඳීමක් සඳහා හේතු වී ඇත. ආයතනික හා ආයතනික නොවන අංශය සංසන්දනය කල විට පොලී අනුපාතිකය අතින් ආයතනික අංශය වැදගත් වේ. අවිධිමත් ග්‍රාමීය වෙළඳපොළේ සංකීර්ණ පොලී අනුපාතික ව්‍යුහයක් දක්නට ලැබේ. එක් ණය සැපයුම්කරුවෙකු වුවද එකම ප්‍රමාණයේ ණය මුදලක් එකම අවශ්‍යතාව සඳහා විවිධ අයදුම්කරුවන්ට ලබා දීමේදී එක් එක් පුද්ගලයාගෙන් එකිනෙකට වෙනස් පොලී අනුපාතිකයන් අයකිරීමෙන් මේ තත්ත්වය වඩාත් ප්‍රබල වෙයි. විධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ පවත්නා සුළු පොලී අනුපාතිකයන් අයකිරීමෙන් මේ තත්ත්වය වඩාත් ප්‍රබල වෙයි. විධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ පවත්නා සුළු පොලී ප්‍රමාණයන් අවිධිමත් ග්‍රාමීය වෙළඳපොළේ පවත්නා පොලී අනුපාතයන්ට වඩා වෙනස් වේ. ආයතනික නොවන අංශය තුලින් ණය ලබා ගැනීමේදී අයකරන ලද මාසික පොලිය 10%*20% අතර වෙයි. මේ නිසා ඇතැම් අවස්ථාවලදී ණය මුදලට සමාන මුදලක් පොලී වශයෙන් ගෙවීමට සිදුවන අවස්ථා ඇත. ආයතනික අංශය අයකරන පොලිය වර්ෂයකට 10%*20% පමණ වේ. ග්‍රාමීය මූල්‍ය වෙළඳපොළේ වඩාත්ම සූරාකන්නන් හා පරපෝෂිතයන් ලෙස හඳුන්වා ඇත්තේ මුදල් පොලියට දෙන්නන්ය.

අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ පොලී අනුපාතික විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න පිලිබඳව ගැටළුවක් පවතී. විධිමත් වෙළඳපොළේ පොලී අනුපාතික නිර්ණය කිරීම නව සම්භාව්‍ය ආර්ථික සංකල්ප ඇසුරෙන් විශ්ලේෂණය කල හැකිය. ග්‍රාමීය ආර්ථිකයෙහි ආර්ථික කටයුතුවලින් බාහිර වූ කරුණුද වැදගත් ලෙස බලපාන හෙයින් අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ පොලී අනුපාතය තීරණය කෙරෙන සාධක සම්භාව්‍ය ආර්ථික විශ්ලේෂණයෙහි සීමාවන්ද ඉක්මවා පිටතට විහිදී යනු ලබයි. තවද ආර්ථික කරුණුවලට බාහිර වූ වෙනත් කරුණු ඉතා ප්‍රමුඛ ලෙස ඉඩම් හෝ ශ්‍රම වෙළඳපොළේ ගණුදෙනු වලින් එතරම් දුරට අර්ථාන්විත ලෙස වෙන් කර දැක්විය නොහැකිය.

න්‍යායාත්මක වශයෙන් සලකා බලන විට ඉහල පොලී අනුපාතික ඇතිවීමට සාධක 4ක් බලපානු ඇත.

(1) මුදලේ ආවස්ථික වියදම් වැඩිවීම.

(2) පරිපාලන වාර මුදල් වැඩිවීම.

(3) අවදානම් වාර මුදල් වැඩිවීම.

(4) වෙළඳපොළේ ඒකාධිකාරයක් පැවතීම.

මුදල් ආවස්ථික වියදම් එක් එක් මුදල් ණයට දෙන පුද්ගලයා අනුව වෙනස් විය හැකිවන අතර කිසියම් මුදල් ණයට දෙන්නෙකුගේ වුවද කාලය අනුව වෙනස් විය හැකිය. එය තීරණය වන්නේ සංකීර්ණ සාධක ගණනාවක බලපෑමෙනි. අනෙකුත් සාධක නොවෙනස්ව පවතීනම් ඉහළ ආවස්ථික වියදම් නිසා පොලී අනුපාතිකය ඉහළ යෑමට හේතුවෙයි. තම ගණුදෙනුකරුවන්ට ක්ෂණිකව ණය සැපයීම සඳහා මුදල් ණයට දෙන්නන්ට ප්‍රමාණවත් මුදලක් ළඟ තබාගැනීමට සිදුවෙයි. ක්ෂණිකව සේවය ලබාදීම අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ වැදගත් ආවේණික ලක්ෂණයකි. කෙසේ වුවද තමන් ළඟ වැඩිපුර තිබෙන මුදල් ප්‍රමාණය සහ එම මුදල ළඟ තබා ගත යුතු වන කාලය යන කරුණු දෙකම පොලී අනුපාතික තීරණය වීම කෙරෙහි බලපානු ලබයි. ණය සඳහා ඇති ඉල්ලුමද එක් එක් කාල සීමාව අනුව වෙනස්වීමද ආවස්ථික වියදම් කෙරෙහි බලපෑම් ඇතිකරයි.

පරිපාලන වියදම්ද පොලී අනුපාතික කෙරෙහි බලපානු ලබයි. පරිපාලන වියදම්වල ලක්ෂණයක් වන්නේ ණය මුදලේ ප්‍රමාණය වැඩිවෙත්ම එම වියදම්වල වැදගත්කම අඩුවීමයි. විශේෂයෙන් අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ පරිපාලන වියදම් වඩා අඩුවේ. අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළ තුලද වෘත්තීය වශයෙන් මුදල් ණයට දෙන්නන්ගේ පරිපාලන වියදම් වෙළඳසැල් හිමියන් විසින් දෙනු ලබන ණය මුදල්වල පරිපාලන වියදම්වලට වඩා වැඩි වේ. ඊට හේතු වී ඇත්තේ වෙළඳසැල් හිමියන් විවිධ ආර්ථික කටයුතුවලට සම්බන්ධ වී සිටීමයි.

ඇතැම් අවස්ථාවලදී ග්‍රාමීය ණය වෙළඳපොළේ පවත්නා ඉහළ පොලී අනුපාතිකයට වැඩිපුරම බලපවත්නා වැදගත් සාධකය අවදානම් වාරිකය වේ. අවදානම් වාරිකය කෙරෙහි බලපාන සාධකය වන්නේ ණය පැහැර හැරීමේ අනුපාතිකයයි. ආයතනික ණය දෙන්නන්ට මෙන්ම ආයතනික නොවන ණය දෙන්නන්ටද ණය පැහැර හැරීම්වලට මුහුණ දීමට සිදුවෙයි. බොහෝ විට අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ ණය ගන්නා අයගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතා දිළිඳු කොටස්වලට අයත් වෙති. ඔවුන්ගේ ආදායම් මට්ටම් වෙළඳපොළේ මිල උච්චාවචනයන් සමඟද වෙනස් වෙති. මෙවැනි අවදානම් තත්ත්වයක් ඇති බැවින් ආයතනික ණය දෙන්නන්ද බොහෝ දුරට තම ණය ප්‍රධානය කිරීමේ කටයුතුවලින් ඈත් කරනු ලබයි. පිලිගත හැකි අගයකින් සුරැකුම්පත් ලබා ගත හැකි නම් අවදානම අඩු කළ හැකිය.

අවිධිමත් ණය ප්‍රධානය කරන්නන් සතු ඒකාධිකාරී බලතල නිසා ග්‍රාමීය අංශයට ඔවුන් ප්‍රධානය කරන ණය මුදල්වල පොලී අනුපාතිකය ඉහළ මට්ටමක පවතින බවට ඇතැම් සමාජ විද්‍යාඥයන් සහ ප්‍රතිපත්ති තීරකයන් විශ්වාස කිරීමට පෙළඹී ඇත.

මෙකී සාධක සැපයුම් අංශයෙන් ඇතිවන සාධක වන අතර ඉල්ලුම් අංශයෙන්ද පොලී අනුපාතික ඉහළ යෑමට බලපාන සාධක කිහිපයක් පවතී. අවිධිමත් ග්‍රාමීය ණය වෙළඳපොළේ ද්‍රවශීලතාවට අනුකූලව ඉල්ලුමෙහි ඇතිවන ශක්තිය ඉල්ලුම් අංශයෙහි වැදගත් සාධකයකි. ඉල්ලුම වැඩිවීම අනුව පොලී අනුපාතිකයද ඉහළ යනු ලබයි. ඒ අනුව ඉහත විශ්ලේෂණය තුලින් පොලී අනුපාතිකය ණය මුදලෙහි මිල තීරණය වීමට බලපාන බව ගම්‍ය වේ. එයට බලපාන අනෙක් සංරචක වනුයේ ණය මුදලෙහි ගණුදෙනු වියදම් වීමට ගමන් වියදම් ණය මුදල ලබා ගැනීමට වැය වූ කාලයෙහි වටිනාකම් ආදිය වේ ( ආර්ථික විමසුම, 1987, පිටුව. 17, 18, 19 ).

**ආයතනික අංශය මගින් ග්‍රාමීය අංශයට ණය සැපයීමේදී මුහුණ දෙන ගැටලු**

ග්‍රාමීය ජනයා, ආයතනික අංශය තුල අඩු පොලී අනුපාතිකයට ණය දෙනු ලැබුවද වැඩි පොලියක් යටතේ ආයතනික නොවන අංශවලින් ණය ලබාගැනීමට පෙළඹෙන බව ඉහතින් පැහැදිලි විය. නමුත් ආයතනික අංශය ග්‍රාමීය ජනයාට ණය සැපයීමේදී මුහුණ දෙන ගැටලු පහත ආකාර වේ.

ග්‍රාමීය අංශයට ණය සැපයීමේ අවදානමක් දක්නට ලැබේ. මෙයට හේතුව විවිධ හේතූන් මත පුද්ගලයන් ණය පැහැර හැරීම දක්නට ලැබීමයි. උදාහරණ ලෙස පහත් ආදායම් මට්ටම, යෙදවුම් නිසි වේලාවට නොලැබීම, ජලය ප්‍රමාණවත් පරිදි නොලැබීම, ව්‍යාප්ති සේවාවන්හි අඩුපාඩුකම් හේතු කොටගෙන අඩු අස්වැන්නක් ලැබීම මෙයට හේතු වී ඇත. මෙම හේතුව නිසා පැහැර හරින ලද ණය ප්‍රමාණය සමස්ථයක් වශයෙන් 17%කි. වගා පාලු වීම නිසා ණය ආපසු ගෙවීම පැහැර හරින ලද ණය ප්‍රමාණය 33%කි.

ණය සපයන ආයතනවල අඩුපාඩුකම් දක්නට ලැබීම තවත් හේතුවක් වේ. නිලධාරීන්ගේ මන්දෝත්සාහීකම දුර්වල සුපරීක්ෂණය, අසතුටුදායක ගිණුම් තැබීම, නිලධාරීන් අවිශ්වාස ලෙස හැසිරීම වැනි කරුණු මේ සඳහා බලපානු ලබයි. මේ හේතුව නිසා පැහැර හරින ලද ණය ප්‍රමාණය 12%කි.

රජයේ ණයක් නිසා ආපසු ගෙවීමේ අවශ්‍යතාවක් නැතැයි සිතීම. ආයතනික අංශයෙන් සැපයෙන ණය මුදල්වලින් වැඩි ප්‍රමාණයක් රජයේ මුදල් වේ. මේ හේතුව නිසා ආපසු ගෙවීම අවශ්‍ය නොවේයයි ඇතැම් අයගේ අදහස වන අතර ඒ සඳහා දැඩි දඬුවමක්ද නොදෙන බව ඔවුන්ගේ විශ්වාසය වේ. මේ හේතුව නිසා පැහැර හරින ලද ණය ප්‍රමාණය 18%කි.

ලබාගත් ණය නියමිත කාර්යය සඳහා නොයෙදවීම, වගා ණය ලබාගත් ඇතැම් පුද්ගලයන් එම ණය පවුලේ කටයුතු සඳහා යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ආපසු ගෙවීම පැහැර හැර ඇත. මේ අන්දමට පැහැර හරින ලද ණය ප්‍රමාණය 15%කි.

ගැමියන් ආයතනික අංශයට සම්බන්ධ කර ගැනීමේ අපහසුතාවක්ද පවතී. ඔවුන් වැඩි දෙනාගේ ප්‍රතිචාරය වන්නේ ආයතනික නොවන අංශයෙන් ණය ලබාගැනීම සඳහාය.

ග්‍රාමීය ජනතාවගේ සිතුම් පැතුම් අනුව ණය සම්පාදනය කළ හැකි ග්‍රාමීය ජනතාවට හිතවත් නිලධාරීන් ආයතනික අංශය තුල ප්‍රමාණවත් පිරිසක් නොසිටීම ( බණ්ඩාර,1996 ).

**ග්‍රාමීය අංශය තුල ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රම**

ග්‍රාමීය අංශය තුල ජනතාවට සහන සැලසීමේ අරමුණින් විවිධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වී ඇත. මෙහිදී කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රම පිලිබඳව අවධානය යොමු කරන ලදී.

ඒ යටතේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ඉන් එකකි. එය ග්‍රාමීය ජනතාවට වී සහ අතිරේක ආහාර භෝග වගා කිරීම සඳහා ආයතනික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමයකි. 1986දී ආරම්භ කරන ලද මෙම ණය යෝජනා ක්‍රමය මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව, ලංකා වානිජ බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාව යන බැංකු තුලින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙතෙක් සපයන ලද ණය වලින් 60%*65% පමණ ප්‍රමාණයක් දී ඇත්තේ වී වගාව සඳහාය. ඉතිරිය අතිරේක ආහාර බෝග වගාව සඳහා සපයන ලදී.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රධානය කරනු ලබන ණය සඳහා බැංකුවලට දැරීමට සිදුවන පාඩුවෙන් 50%කින් දක්වා ඇප ආවරණ මහ බැංකුව මගින් සපයනු ලැබේ. මහ බැංකුව ප්‍රතිමූල්‍ය සපයන හෙයින් අයකරන පොලී අනුපාතය 9%කි.

මෙම ණය ක්‍රමය මීට පෙර තිබූ ණය යෝජනා ක්‍රමවලට වඩා සාර්ථක වී ඇති අතර ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය 75%ක් පමණ වේ ( ප්‍රනාන්දු,1993 ).

1994 සිට ශ්‍රී ලංකා රජය හා මහ බැංකුව තීරණය කරන පොලී සහනාධාරයක් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වූ බෝග වගාව සඳහා ලබාදෙන ණය සඳහා ප්‍රධානය කෙරිණි. ණය දෙන්නා වූ බැංකු සිය අරමුදල්වලින් ණය පහසුකම් ජනතාවට දෙනු ලැබේ. පූර්ව වගා කටයුතු සඳහා මෙම ක්‍රමය යටතේ සහනදායි පොලී අනුපාතයක් මත රෝපණ ද්‍රව්‍ය සැකසීම හා බීජ

නිෂ්පාදන සඳහා ණය ලබාගත හැකිය. ණය ලාභියෙකුට ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 5කි.

වී වගාව සඳහා අක්කරයකට දෙන ලද උපරිම ණය පරිමාව වාරිමාර්ග හා වැසිදිය යටතේ වෙනස් වේ. වාරිමාර්ග වලින් වගා කටයුතු කරන විට දෙනු ලබන උපරිම ණය පරිමාව රුපියල් 25,000ක් වන අතර වැසිදියෙන් වගා කටයුතු සඳහා දෙනු ලබන උපරිම ණය පරිමාව රුපියල් 15000ක් වේ ( http://www.cbsl.gov.lk ).

එමෙන්ම ග්‍රාමීය බැංකු මගින් ණය සැපයීමද තවත් එක් ක්‍රමයක් වේ. ග්‍රාමීය බැංකුවක් යනු විවිධ සේවා සමූපකාර සමිතියක බැංකු කටයුතු හා ණය පිලිබඳ කටයුතු කරන අංශය වේ. එමෙන්ම මහජන බැංකුවේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කරන සමූපකාර සමිතියෙකි. ග්‍රාමීය බැංකු පුළුල් කිරීමෙන් ගොවියාගේ ජීවන තත්ත්වය යහපත් අතට හැරවිය හැකිවේ යන්න මතය වේ. ප්‍රධාන වශයෙන් මෙම බැංකුව විසින් කරනු ලබන්නේ ගොවි ජනතාවට අවශ්‍ය ණය පහසුකම් සැලසීම හා ඔවුන්ගේ ඉතිරිකිරීම් භාර ගැනීම වේ. ආයතනික නොවන මාර්ගවලින් ණය මුදල් ලබා ගැනීම හේතු කොටගෙන අනාදිමත් කාලයක් තිස්සේ ගැමි ගොවියාට විඳින්නට සිදු වූ අතවරයන්ගෙන් මුදලනු වස් ඔවුන්ගේ අවශ්‍යතාවයට සරිලන වස් සැපයිය හැකි සෑම ණය පහසුකමක්ම සැපයීම මෙමඟින් සිදුවේ. රුපියල් 5000 දක්වා වන ණය සඳහා පිලිගත් සාමාජිකයින් දෙදෙනෙකුගේ ඇපය ප්‍රමාණවත් වේ ( ආර්ථික විද්‍යා, 2003, පිටුව.209 ). ඊට වඩා වැඩි මුදලක් සඳහා දේපල ඇපයක් තිබිය යුතුය.

ස්වර්ණාභරණ උකසට ගෙන ණය පහසුකම් සැලසීම සමූපකාර ග්‍රාමීය බැංකු මගින් ඉතා සාර්ථක ලෙස කරනු ලබන ණය දීමේ කාර්යය වේ. තමාගේම අරමුදල් යොදාගෙන හෝ මහජන බැංකුවෙන් අයිරාවක් ලබාගෙන උකස් කටයුතු ආරම්භ කිරීමට සමූපකාර ග්‍රාමීය බැංකුවලට හැකිය. සෑම සාමාජිකයෙකුටම හා සාමාජික නොවන පුද්ගලයන්ටද අත්‍යාවශ්‍ය හා පරිභෝජන අවශ්‍යතා සඳහා උකස් ණය ලබාගත හැකිය. මෙම අත්තිකාරම් මුදල් අවුරුද්දක් ඇතුලත ගෙවිය යුතුවේ. වාර්ෂික පොලිය ගෙවා ණය මුදල්ද අළුත් කර ගත හැකිවේ. බැංකුව මේ සඳහා අරමුදල් සපයන්නේ 23%ක වාර්ෂික පොලියක් යටතේය. සමූපකාර ග්‍රාමීය බැංකුව උකස් ණය සඳහා වාර්ෂික පොලිය ලෙස 28%*30%ක් අයකරනු ලැබේ (එහිම, පිටුව. 210 ).

ග්‍රාමීය බැංකු මගින් විවිධ අරමුණු සඳහා ණය දෙනු ලැබේ. ඒ අතර නිෂ්පාදන අංශය යටතේ ආහාර, වෙළඳභෝග, සුළු පරිමාණ වගාවන්, ගෘහ කර්මාන්ත, සතුන් ඇති කිරීම, ධීවර කටයුතු වේ. ඒ සඳහා දෙනු ලබන උපරිම ණය සීමාව රුපියල් 5000ක් වේ. සෑම ණය මුදලක් සම්බන්ධවම ගිවිස ගත් ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදයක් ඇතිවිට එවැනි ණය මුදල් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමා සහ සමිතියේ මධ්‍යම මණ්ඩලය මගින් අනුමත කළ යුතුවෙයි.

රුපියල් 5000ක උපරිමයක් දක්වා වූ ණය මුදල් හුදෙක්ම පුද්ගලික ඇපවීම් මත දෙනු ලැබේ. ඇපකරුවන් දෙදෙනා සමිතියේ සාමාජිකයින් විය යුතු අතර ඔවුන් ණය මුදල් ලබා ගැනීම සඳහා සුදුසු අය විය යුතුය. ණය ඉල්ලා සිටින සෑම සාමාජිකයෙකුටම ග්‍රාමීය බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කරන ලෙස ඉල්ලා සිටිනු ලබයි.

ආයතනික අංශය තුලින් ණය ලබා ගැනීමේදී ඉහත ආකාරයේ සුදුසුකම් තිබිය යුතුය. නමුත් ග්‍රාමීය ජනතාවගෙන් බහුතරයකට එවැනි සුදුසුකම් නොමැති බැවින් ඔවුන් ආයතනික නොවන අංශය කෙරෙහි පෙළෙඹෙනු ලබයි.

ප්‍රාදේශීය වශයෙන්ද ණය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 1949 අංක 58 දරන මුදල් නීති පණතේ අංක 108 (1) ඡේදයට අනුව විශේෂ සංවර්ධන වැඩසටහන් යටතේ ඇප ආවරණ ලැබීමට සුදුසු බැංකු ආයතන විසින් ප්‍රධානය කරන ලද ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස හෝ රජය වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ණය දෙන ආයතන විසින් සුළු පරිමාණ ව්‍යවසායකයින්ට දෙන ලද ණය අත්තිකාරම් හා අනෙකුත් පහසුකම් සඳහාද ඇප ආවරණ සැපයීමට හැකිවනු පිණිස 1974දී මුදල් නීති පණතේ 108 ඡේදයට 108 (අ) ලෙස සංශෝධනයක් ගෙන එන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුළු පරිමාණ

ව්‍යවසායකයින් හා කෘෂිකර්මාන්ත කටයුතු සඳහා ක්‍රියාත්මක වන ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට මෙම සංශෝධනය පිටිවහලක්ව ඇත ( httpp:// www.cbsl. gov.lk ).

ආධාර සපයන ආයතනවලින් හා රජය විසින් සපයන අරමුදල්වලින් කරගෙන යනු ලබන ණය වැඩසටහන් , තෝරාගත් සහභාගිත්ව මූල්‍යායතන හරහා එක් එක් ප්‍රදේශයන්හි ප්‍රධාන ආර්ථික අරමුණු පෙරදැඩි කරගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

3. දෙවන බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SPCDPRE )

මෙම ණය යෝජනා ක්‍රමය 2006 වර්ෂයෙන් ආරම්භ වී 2014 කාලය දක්වා ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබයි. මෙහි අරමුණ වනුයේ බහු වාර්ෂික බෝග අංශයේ වානිජකරණය, නිෂ්පාදනය දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අස්වනු මෙහෙයුම් කටයුතු,නිෂ්පාදන සැකසීම, හා වෙළඳපොළ පහසුකම් ලබාදීම යනාදියයි. රුපියල් බිලියන 1.2 ක් මෙම ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇත ( ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2009 ).

4. තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (TDPRE )'

ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබයි. කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම මෙහි පරමාර්ථය වේ. රුපියල් බිලියන 1.1ක් මේ සඳහා වෙන් කර ඇත. 9%ක පොලී අනුපාතය යටතේ ණය පහසුකම් ලබා දෙනු ලබයි.

5. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS )

6. වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහභාගිවීමේ හා හවුල්වීමේ වැඩසටහන

7. කුඩා පරිමාණ බාහිර වැවිලිකරුවන්ගේ සංවර්ධන වැඩසටහන

8. සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය

9. දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය

මෙම ණය යෝජනා ක්‍රම සඳහා අරමුදල් සපයනු ලැබුවේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් , සහභාගිත්ව ණය ආයතන හා සහභාගිත්ව මූල්‍ය ආයතනවලින් ලැබුණු වාරික සහ ආයෝජන ආදායම් මගිනි.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අරමුදල් සැපයූ ණය යෝජනා ක්‍රම පහත පරිදි වේ.

1. කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය ( ARP )

2. බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය ( PCDP )

3. කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධන ණය යෝජනා ක්‍රමය ( SHTDP )

4. වැවිලි අංශයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (PSRP )

එමෙන්ම ශ්‍රී ලංකා රජය අරමුදල් සැපයූ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම පහත ඒවා වේ.

1. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ( NSRCS )

2. තේ සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය ( TDP )

3. දෙවන බහු වාර්ෂික භෝග සංවර්ධන ණය යෝජනා ක්‍රමය ( SPCDP )

( http:// www.cbsl.gov.lk ).

**නිගමනය**

ග්‍රාමීය අංශය තුල පවතින කෘෂිආර්ථිකය තුල මූල්‍ය අවශ්‍යතා පිළිබඳව විශාල ගැටලුනකට ග්‍රාමීය ජනතාව මුහුණ දී ඇත. එම අවශ්‍යතාව සපුරාලීමට රජය සහ මහබැංකුව විවිධ ණය යෝජනා ක්‍රමද ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම ජනතාව විධිමත් සහ අවිධිමත් අංශවලින් එම ණය යෝජනා ක්‍රමවලින් ණය ලබා ගැනීමට අමතරව ණය ලබාගනියි. එහිදී අවිධිමත් අංශය තුල ණය ලබාගැනීමේදී අධික පොලියකට ණය ලබාගැනීමට සිදුවෙයි. නමුත් විධිමත් අංශය තුල ණය ලබාගැනීමට යාමේදී ග්‍රාමීය ජනතාවට එහිදී සිදුවන කරදර ආදායට මුහුණදීමට සිදුවේ. එනම් ඇපකරුවන් අවශ්‍ය වීම බැංකු ගිණුමක් තිබිය යුතු වීම ප්‍රමාණවත් මුදලක් ගිණුම තුල තිබිය යුතු වීම කාලය ගතවීම ආදී ගැටලුවලටයි. නමුත් අවිධිමත් අංශය තුල වැඩි පොලියක් යටතේ වුවද ඉක්මනින් පහසුවෙන් ණය ලබාගැනීමට ඔවුන්ට හැකියාව ඇත. එම නිසා ග්‍රාමීය ජනතාව බොහෝවිට විධිමත් අංශයට වඩා අවිධිමත් අංශය තුල ණය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.

**ආශ්‍රිත මූලාශ්‍ර**

ප්‍රනාන්දු ,මර්වින් වින්සන් (1993), ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑතකාලීන ප්‍රවණතා, මයිකි මුද්‍රණ ශිල්පියෝ, මොරටුව.

බණ්ඩාර පී.එම්.එන්. (1996), ප්‍රායෝගික ආර්ථික විද්‍යාව, රත්න පොත් ප්‍රකාශකයෝ. කොළඹ 10.

සෙනෙවිරත්න, ලාල් ( 1968 ), මූලික ආර්ථික ප්‍රශ්න ( ලංකාව හා ඌණ සංවර්ධිත රටවල් ආශ්‍රිතවයි.) ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ 10.

බණ්ඩාර මාලතී ඉන්දිකා ඒ.එම්. (2003), ශ්‍රී ලංකාවේ ග්‍රාමීය බැංකුවල කාර්යභාරය පිළිබඳ විමසීමක්, *ආර්ථික විද්‍යා*, 3 වෙළුම, 1 කලාපය, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය. පි. 200-212

වීරරත්න සී.එස්, ( 1987 ), වැවිලි භෝග නිෂ්පාදනයේ සුළු වතු හිමියන්ගේ කාර්යභාරය,*ආර්ථික විමසුම*, 13 වෙලුම, පි. 5-12

ගැමිණය තොරතුරු, (1986), 4 කාණ්ඩය, 11 කලාපය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනයකි.

ග්‍රාමීය ණය, (1979). ආර්ථික විමසුම,

ශ්‍රී ලංකා මහ බැංකුව 2009 මහ බැංකු වාර්ෂික වාර්තාව කොළඹ

http://www.peoplesbank.lk/products/krushi-navodaya.

http://web.boc.lk.

http://www.cbsl.gov.lk